# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2023

**11 ශ්‍රේණිය**

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය - II

නම/ විභාග අංකය: ........................................ කාලය පැය 2 යි

**පළමුවන ප්‍රශ්නය ඇතුළුව I කොටසෙන් ප්‍රශ්න දෙකක් ද II කොටසෙන් ප්‍රශ්න දෙකක් ද බැගින් තෝරා ගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

01) පහත සිද්ධිය ඇසුරෙන් අංක (i) සිට (x) දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ රෙදිපිළි මෝස්තර හා නිර්මාණකරණය පිළිබඳ පාඨමාලාවක් සාර්ථකව නිමකළ සචින් විසින් ඔහු සතු රු.200,000 ක මුදල ද රු.500,000ක් වටිනා තම මෝටර්රථය ද ලංකා බැංකුවෙන් 12% ක වාර්ෂික පොලියක් යටතේ ලබාගත් රු.300,000ක බැංකු ණය මුදලද යොදවා 2023.01.01 දින "සචින් ස්පෝර්ට් වෙයාර්" නමින් ක්‍රීඩා ඇඳුම් පැළඳුම් මසා අලෙවි කිරීමේ ව්‍යාපාරයක් මිනුවන්ගොඩ නගරය ආසන්නයේ ආරම්භ කරන ලදි. ව්‍යාපාරයට පළපුරුදු සේවිකාවන් දෙදෙනෙක් ද බඳවා ගත් සචින් පාසල්වල ක්‍රීඩා පුහුණුකරුවන් හා ක්‍රීඩා සංගම්වල පුහුණුකරුවන් පෞද්ගලිකව හමුවී ඔවුන්ට වට්ටම් හා වෙනත් පහසුකම් ලබා දෙමින් ඇණවුම් වැඩිකර ගනිමින් තම ව්‍යාපාර කටයුතු සාර්ථකව පවත්වාගෙන යයි. මෑතකදී රජය විසින් රෙදිපිළි සම්බන්ධව ආනයන සීමා පැනවීම හේතුවෙන් අමුද්‍රව්‍ය මිල ඉහළ යාම නිසා තම නිෂ්පාදනවල මිල 10% කින් පමණ ඉහළ දැමීමට සචින් තීරණය කර ඇත.

2023 ජනවාරි මස පහත ගනුදෙනු සිදුවිය.

| | රු. |
|---|---|
| මහන යන්ත්‍ර හා උපකරණ මිලදී ගැනීමට | 300 000 |
| අමුද්‍රව්‍ය අත්පිට ගැනුම් | 250 000 |
| අමුද්‍රව්‍ය ණයට ගැනුම් | 125 000 |
| සේවක වැටුප් | 40 000 |
| විදුලි වියදම් | 15 000 |
| ගොඩනැගිලි කුලී | 25 000 |
| ප්‍රවාහන වියදම් | 10 000 |
| විකුණුම් | 250 000 |

**අමතර තොරතුරු**

2023.01.31 දිනට තොග කිසිවක් ඉතිරි වී නොමැත.
යන්ත්‍ර හා උපකරණ වාර්ෂිකව 12% බැගින් ක්ෂය කළ යුතුයි.

i. (අ) සචින්ගේ ව්‍යාපාරය සපයන මිනිස් වුවමනාව කුමක්ද?
(ආ) මෙම ව්‍යාපාරයේ නිෂ්පාදන සාධක දෙකක් නම් කර ඒවාට නිදසුන් සිද්ධිය ඇසුරෙන් දක්වන්න.

ii. (අ) මෙම ව්‍යාපාරයේ ශක්තියක් හා ව්‍යාපාරික තර්ජනයක් ලියන්න.
(ආ) මෙම ව්‍යාපාරයේ අභ්‍යන්තර පරිසර සාධක දෙකක් නම් කර සිද්ධිය ඇසුරින් නිදසුන් දක්වන්න.

iii. (අ) මෙම ව්‍යාපාරය අයත්වන ව්‍යාපාර සංවිධාන වර්ගය කුමක්ද?
(ආ) ඔබ සඳහන් කළ ව්‍යාපාර සංවිධානයේ ලක්ෂණ දෙකක් ලියන්න.

iv. (අ) කළමනාකරණ කාර්යයන් වන සංවිධානකරණයට නිදසුනක් සිද්ධිය ඇසුරෙන් දක්වන්න.
(ආ) මෙම සිද්ධිය ඇසුරෙන් අලෙවිකරණ මිශ්‍රයේ මිල විලාසයට නිදසුනක් ලියන්න.

v. 2023.01.01 දිනට මෙම ව්‍යාපාරයේ ගිණුම්කරණ සමීකරණය අගයන් සහිතව ලියා දක්වන්න.

vi. (අ) මෙම ව්‍යාපාරයේ වත්කමක් වැඩි වී වත්කමක් අඩුවන ගනුදෙනුවක් ලියන්න.
(ආ) මෙම ව්‍යාපාරය භාවිතා කරන මූලික සටහන් පොත් දෙකක් ලියන්න.

vii. (අ) 2023 ජනවාරි මාසය සඳහා බැංකු ණය පොළිය කොපමණද?
(ආ) බැංකු ණය පොළී ලෙජර් ගිණුම්වල සටහන් කිරීමට අදාළ ද්විත්ව සටහන ලියන්න.

viii. 2023.01.31 දිනට මෙම ව්‍යාපාරයේ මුදල් ශේෂය ගණනය කරන්න.

ix. 2023.01.31 දිනට මෙම ව්‍යාපාරයේ ශුද්ධ ලාභය හෝ අලාභය ගණනය කරන්න.

x. (අ) මෙම ව්‍යාපාරයේ 2023.01.31 දිනට ජංගම නොවන වත්කම්වල වටිනාකම කොපමණද?
(ආ) මෙම ව්‍යාපාරයේ 2023.01.31 දිනට සචින්ගේ හිමිකම කොපමණද?

(මුළු ලකුණු 20)

02)

i. (අ) ව්‍යාපාරයක් යනු කුමක්ද?
(ආ) ව්‍යාපාරවල අරමුණු දෙකක් ලියන්න. (ල 2)

ii. පහත දැක්වෙන ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.
(අ) අවශ්‍යතා ව්‍යාපාර විසින් නිර්මාණය කරනු ලබයි. ( )
(ආ) නිෂ්පාදන සාධක භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය හා ව්‍යවසාය ලෙස වර්ග කළ හැක. ( )
(ඉ) ශ්‍රම ඵලදායිතාවය වැඩිකිරීම කළමණාකරුවන් විසින් ව්‍යාපාරවලට ලබාදෙන දයකත්වයකි. ( )
(ඊ) අයවැය ප්‍රතිපත්ති ආර්ථික පරිසර සාධකයට නිදසුනකි. ( )
(ල. 2)

iii. පාසල් සමයේ මිතුරියන් වූ ඉෂිනි හා එෂිනි එක්ව රූපලාවන්‍ය පාඨමාලාවක් හැදෑරීමෙන් අනතුරුව පළපුරුදු සේවිකාවන් දෙදෙනෙකුගේ ද සහය ඇතිව "රූෂිනී බියුටි සැලෝන්" නමින් රූපලාවන්‍ය ආයතනයක් ආරම්භ කරන ලදි.
(අ) රූෂිනි බියුටි සැලෝන් ව්‍යාපාරය කෙරෙහි උනන්දුවක් දැක්විය හැකි පාර්ශව දෙකක් සඳහන් කරන්න.
(ආ) ඔබ සඳහන් කළ එම පාර්ශවයක් මෙම ව්‍යාපාරය කෙරෙහි උනන්දුවක් දැක්වීමට හේතුව බැගින් ලියන්න.
(ල. 2)

iv. ඉතාලියේ රැකියාව කර මෙරටට පැමිණි මිතුරන් තිදෙනෙකු නවීන තාක්ෂණය අනුව නිෂ්පාදිත මෝටර් රථ සඳහා අවශ්‍ය අමතර කොටස් සහ එම වාහන සඳහා සේවා පහසුකම් සැපයීමේ ව්‍යාපාරයක් ආරම්භ කිරීමට බලාපොරොත්තු වේ. ව්‍යාපාරයේ නමින් වත්කම් මිලදී ගැනීමට හා ගිවිසුම්වලට එළඹිය හැකි ආකාරයේ ව්‍යාපාර සංවිධානයක් ආරම්භ කිරීම වඩාත් සුදුසු බව ඔවුන්ගේ අදහසයි.
(අ) ඉහත මිතුරන් තිදෙනා සඳහා ඔබ යෝජනා කරන ව්‍යාපාර සංවිධානය කුමක්ද?
(ආ) ඉහත (අ) යටතේ ඔබ සඳහන් කළ ව්‍යාපාර සංවිධානයේ දැකිය හැකි වාසියක් හා අවාසියක් ලියන්න. (ල. 2)
(මුළු ලකුණු 8)

03)

i. (අ) වෙළෙඳම යනු කුමක්ද?

(ආ) ව්‍යාපාරික කටයුතුවලට සහය වන උපකාරක සේවා දෙකක් ලියන්න. (ල. 2)

ii. පහත දැක්වෙන ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.

(අ) සිල්ලර වෙළෙන්ද පාරිභෝගිකයා සමග සෘජුවම සම්බන්ධ වේ. (      )

(ආ) ස්ථාවර තැන්පතු සඳහා ලැබෙන පොළී ප්‍රතිශතය තැන්පතු කාලය අනුව වෙනස් නොවේ.(      )

(ඉ) රක්ෂණ ආවරණය ලබන පාර්ශ්වය රක්ෂණයේ පළමු පක්ෂය ලෙස හැඳින්වේ. (      )

(ඊ) පණිවුඩය ලබන්නා පණිවුඩය සම්බන්ධයෙන් ක්‍රියාකරන ආකාරය ප්‍රතිපෝෂණයයි. (      )

(ල. 2)

iii. නිමි ඇඳුම් අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යන තාරුකා ඇයගේ ව්‍යාපාරය සඳහා රු.2,500,000 ක් වටිනා ගිනි උවදුරු රක්ෂණ ඔප්පුවක් ලබාගෙන ඇත. හදිසියේ ඇති වූ විදුලි කාන්දුවක් හේතුවෙන් ගොඩනැගිල්ලේ කොටසක් හා නිමි ඇඳුම් විශාල ප්‍රමාණයක් ගින්නෙන් හානියට පත් විය. තාරුකා මෙම සිද්ධිය දුරකථන මාර්ගයෙන් රක්ෂණ සමාගම වෙත දැනුම් දුන් අතර රක්ෂණ සමාගමේ නිලධාරීන් පැමිණෙන බව ඇයට ප්‍රකාශ කරන ලදි. පසුව සිදුවූ හානියේ වටිනාකම රු.2,000,000කට තක්සේරු කරන ඇත.

(අ) තාරුකාට ලැබෙන රක්ෂණ වන්දිය කොපමණද? ඊට බලපාන රක්ෂණ මූලධර්මය කුමක්ද?

(ආ) සන්නිවේදන ක්‍රියාවලියේ පහත දැක්වෙන මූලිකාංගවලට අදළ නිදසුන් ඉහත සිද්ධිය ඇසුරින් දක්වන්න.

1. ලබන්නා          2. ප්‍රතිපෝෂණය

(ල. 2)

iv. නන්දන කොළඹ පිටකොටුවේ ව්‍යාපාරිකයකු වන සුන්දරම්ගෙන් මයිසූර් පරිප්පු විශාල තොග වශයෙන් මිලට ගෙන තම කුඩා ලොරි රථයෙන් සතිපොළවල වෙළඳාම් කරන වෙළෙන්දන්ට අලෙවි කරයි.

(අ) ඉහත සිද්ධියේ දැක්වෙන තොග වෙළෙන්දකු හා සිල්ලර වෙළෙන්දෙකු පිළිවෙළින් නම් කරන්න.

(ආ) ප්‍රවාහන මූලිකාංග වලට අදලව නන්දන යොද ගන්නා මාර්ගය හා බලයට අදළ නිදසුන් පිළිවෙළින් ලියා දක්වන්න. (ල. 2)

(මුළු ලකුණු 8)

04)

i. (අ) කළමනාකරණය යනු කුමක්ද?

(ආ) අලෙවිකරණයට අයත් කටයුතු දෙකක් ලියන්න. (ල. 2)

ii. පහත දැක්වෙන ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.

(අ) ලෝකයේ දියුණු රටවල මිනිස් වුවමනාවන් තෘප්තිමත් කිරීම සඳහා පවතින සම්පත් අසීමිත වේ. (      )

(ආ) ව්‍යාපාරික අරමුණු අපේක්ෂිත අයුරින් ඉටුකර ගැනීම කාර්යක්ෂමතාව වේ. (      )

(ඉ) වෙළඳපොළක් යනු ගැනුම්කරුවන් හා විකුණුම්කරුවන් හමුවන නිශ්චිත ස්ථානයකි. (      )

(ඊ) විකිණීමෙන් පසු සේවා සැපයීමේ කටයුතු ද අලෙවිකරණයට අයත් වේ. (      )

(ල. 2)

iii. සී/ස මිලේකා සමාගම විසින් ඉහළ පෝෂණ ගුණයෙන් යුතු චීස් වර්ගයක් නිෂ්පාදනය කිරීමට තීරණය කළ අතර ඒ සඳහා නවීන තාක්ෂණයෙන් යුත් යන්ත්‍රයක් නවසීලන්තයෙන් මිලදී ගන්නා ලදි. යන්ත්‍රය ක්‍රියාත්මක කිරීමට පලපුරුදු සේවකයන් දෙදෙනෙකු යොදවා අවශ්‍ය පුහුණුව හා උපදෙස් ඔවුන්ට ලබා දුන් අතර නිෂ්පාදන ක්‍රියාවලියේ සෑම අවස්ථාවකදීම ගුණත්වය පරීක්ෂා කිරීම තත්ත්වපාලන නිළධාරියා විසින් සිදුකරනු ලබයි.

කළමනාකරණ කාර්යයන් හතර දක්වා එම එක් එක් කාර්යය සඳහා නිදසුන් ඉහත සිද්ධිය ඇසුරෙන් තෝරා පහත ආකාරයේ වගුවක දක්වන්න.

| | කළමණාකරණ කාර්යය | සිද්ධියේ සඳහන් නිදසුන |
|---|---|---|
| 1 | | |
| 2 | | |
| 3 | | |
| 4 | | |

iv. ගුණසිරි ස්වයං රැකියාවක් ලෙස තලකැරලි නිෂ්පාදනය කර අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යයි. ගුණසිරි නිෂ්පාදනය කරන තලකැරලි නගරයේ බැංකු හා රාජ්‍ය ආයතවල සේවකයන්ට ඔහු විසින්ම අලෙවි කිරීමේ කටයුතු සිදුකරනු ලබයි.

(අ) ගුණසිරිගේ ව්‍යාපාරයේ අලෙවිකරණ මිශ්‍රයේ විචල්‍යයන් දෙකක් සඳහන් කර සිද්ධිය ඇසුරෙන් නිදසුන් දක්වන්න.

(ආ) ගුණසිරි තම නිෂ්පාදිත බෙදහරින ක්‍රමය අලෙවිකරණයේ දී කිනම් නමකින් හැඳින්වේද?

(මුළු ලකුණු 8)

## II කොටස - ගිණුම්කරණය

05)

i. (අ) ගිණුම්කරණය යනු කුමක්ද?

(ආ) ව්‍යාපාරයක අයිතිකරුවන්ගේ හිමිකම වෙනස්වීමට බලපාන කරුණු දෙකක් ලියන්න.

(ල 2)

ii. පහත සඳහන් ගනුදෙනුවල ද්විත්ව සටහන් ලියන්න.

(අ) බැංකු ණය පොළී රු.5,000 ක් මුදලින් ගෙවීම

(ආ) ව්‍යාපාරයේ ප්‍රයෝජනය සඳහා රු.25,000ක කාර්යාල උපකරණ සාගර සමාගමෙන් ණයට ගැනීම.

(ල 2)

iii. ව්‍යාපාරයක 2023.03.01 දිනට පැවති වත්කම්, හිමිකම් හා වගකීම් ශේෂ සහ මාර්තු මාසයේ පළමු සතිය තුළ සිදුවූ ගනුදෙනු ගිණුම්කරණ සමීකරණයේ දක්වා තිබූ ආකාරය පහත දැක්වේ.

| | වත්කම් (රු) | = | හිමිකම (රු) | + | වගකීම් (රු) |
|---|---|---|---|---|---|
| 2023.03.01 ශේෂය | 250 000 | = | 150 000 | | 100 000 |
| 03/2 | +15 000 (බඩු තොගය) | = | | | +15000 (ණයහිමියෝ) |
| 03/4 | -5000 (බඩු තොගය)<br>+7000 (මුදල්) | = | +2000 (ලාභය) | | |
| 03/5 | -4000 (මුදල්) | = | -4000 (විදුලිය) | | |
| 03/7 | -10000 (මුදල්) | = | | | -10000 (බැංකු ණය) |

**අවශ්‍ය වන්නේ**

(අ) ඉහත එක් එක් ගනුදෙනුව අගයන් සහිතව ලිවීම

(ආ) සතිය අවසානයේදී මුළු වත්කම්වල හා මුළු හිමිකමේ වැඩිවීම හෝ අඩුවීම වෙන වෙනම දැක්වීම.

(ල 4)

iv. තුෂාරගේ ව්‍යාපාරයේ ගිණුම්ලිපිකරු විසින් 2023 අප්‍රේල් මාසය තුළ සිදුකරන ලද ගනුදෙනු ඇසුරින් සකස් කරන ලද මුදල් ගිණුම පහත දැක්වේ.

**මුදල් ගිණුම**

| දිනය | ලදු. අං | විස්තරය | ස/පි | වටිනාකම රු. | දිනය | වවු. අං | විස්තරය | ස/පි | වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|---|---|
| 4/1 | | ශේෂය ඉ/ගෙ | | 150,000 | 4/5 | 001 | ගැනුම් ගිණුම | | 20,000 |
| 4/12 | 01 | ණයගැති ගිණුම | | 12,000 | 4/18 | 002 | විදුලිගාස්තු ගිණුම | | 5,000 |
| 4/22 | 02 | විකුණුම් ගිණුම | | 8,000 | 4/30 | | ශේෂය ප/ගෙ | | 145,000 |
| | | | | 170,000 | | | | | 170,000 |
| 5/1 | | ශේෂය ඉ/ගෙ | | 145,000 | | | | | |

**අවශ්‍ය වන්නේ**

(අ)  එක් එක් දිනයේ සිදුවූ ගනුදෙනු වටිනාකම් සහිතව දින අනුපිළිවෙළට දැක්වීම.
(ආ) මුදල් ගිණුමේ සටහන් කළ ගනුදෙනු ලෙජර් ගිණුම්වල දැක්වීම

(ල 4)
(මුළු ලකුණු 12)

06)

i. (අ) මූලික සටහන් පොත් යනු කුමක්ද?
(ආ) මූලාශ්‍ර ලේඛනවල ප්‍රයෝජන දෙකක් ලියන්න. (ල 2)

ii. පරිගණක ආශ්‍රිත ගිණුම්කරණයේ වාසි දෙකක් ලියන්න. (ල 2)

iii. සඳරුගේ ව්‍යාපාරයේ 2023.05.31 දිනට බැංකු ගිණුමේ තිබූ වාසිදයක ශේෂය රු.45 000කි. එදිනට බැංකුවෙන් එවන ලද බැංකු ප්‍රකාශනයේ ශේෂය ඊට වෙනස් විය. මෙම ශේෂ වෙනස්වීමට බලපෑ හේතු පහත දැක්වේ.

1. මැයි මාසයේ දී ණයහිමියෙකුට නිකුත්කරන ලද රු.12 000ක චෙක්පත බැංකුවට ඉදිරිපත් කර නොතිබීම.
2. ස්ථාවර නියෝග මත බැංකුව විසින් ගෙවූ ලීසිං වාරිකය රු.35 000 කි.
3. ණයගැතියෙකු විසින් රු.25 000ක් සෘජුවම ව්‍යාපාරයේ බැංකු ගිණුමේ තැන්පත් කිරීම.
4. මැයි මාසය තුළ බැංකුවේ තැන්පත් කළ රු.8000ක චෙක්පත නිශ්කාශනය වී නොතිබීම.

**අවශ්‍ය වන්නේ**

(අ)  2023.05.31 දිනට බැංකු ගිණුමේ ශේෂය සංශෝදනය කිරීම.
(ආ) 2023.05.31 දිනට බැංකු සැසඳුම් විස්තරය පිළියෙල කිරීම.

(ල 4)

iv. (අ) නිසංසලාගේ ව්‍යාපාරයේ 2023 මැයි මාසයට අදළ ණයට විකුණුම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| දිනය | ඉන්වොයිස් අංකය | ගැනුම්කරු | ඉන්වොයිසියේ සඳහන් ශුද්ධ වටිනාකම (රු) |
|---|---|---|---|
| 2023.05.02 | 815 | අනිල් | 15,000 |
| 2023.05.12 | 816 | සුනිල් | 12,000 |
| 2023.05.23 | 817 | විනිල් | 14,000 |

අවශ්‍ය වන්නේ

- නිසංසලාගේ ව්‍යාපාරයේ විකුණුම් ජර්නලය පිළියෙල කිරීම. (ල. 2)

(ආ) සිතාරාගේ ව්‍යාපාරයේ 2023 ජනවාරි මාසය සඳහා පිළියෙළ කළ සුළු මුදල් පොත පහත දැක්වේ.

**සුළු මුදල් පොත**

| ලැබීම් | ස/පි | දිනය | විස්තරය | ව/අ | ගෙවීම් රු. | විශ්ලේෂණ තීරු | | | ලෙජර් ගිණුම | ලෙජර් පිටුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | ගමන් වියදම් | සංග්‍රහ වියදම් | ලිපිද්‍රව්‍ය | | |
| 400 | | 1/1 | ශේෂය ඉ/ගෙ | | | | | | | |
| 1600 | | 1/1 | මුදල් | | | | | | | |
| | | 1/5 | සිසිල් පැන් | | 200 | | 200 | | | |
| | | 1/12 | ත්‍රීරෝද රථ ගාස්තු | | 400 | 400 | | | | |
| | | 1/17 | පෑන් | | 100 | | | 100 | | |
| | | 1/20 | පියදසට ගෙවීම් | | 500 | | | | 500 | |
| | | 1/22 | බිස්කට් | | 300 | | 300 | | | |
| | | 1/25 | කුලී රථ ගාස්තු | | 200 | 200 | | | | |
| | | | | | 1700 | 600 | 500 | 100 | 500 | |
| | | 1/31 | ශේෂය ප/ගෙ | | 300 | | | | | |
| 2000 | | | | | 2000 | | | | | |
| 300 | | 2/1 | ශේෂය ඉ/ගෙ | | | | | | | |

**අවශ්‍ය වන්නේ**

(අ) ව්‍යාපාරයේ සුළු මුදල් අග්‍රිමයේ වටිනාකම ලියා දැක්වීම

(ආ) 2023.02.01 දිනට ප්‍රතිපූරණය කළ යුතු මුදල ලියා දැක්වීම

(ල 2)

(මුළු ලකුණු 12)

07)

i. (අ) ශේෂ පිරික්සුම යනු කුමක්ද?

(ආ) ගිණුම්කරණ වැරදි සිදුවිය හැකි අවස්ථා දෙකක් ලියා දක්වන්න. (ල 2)

ii. (අ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයක මූලිකාංග දෙකක් ලියන්න.

(ආ) බොල් ණය ගිණුම්ගත කිරීමට අදළ ද්විත්ව සටහන ලියන්න. (ල 2)

iii. හසරංගගේ ව්‍යාපාරයේ 2022.12.31 දිනට පිළියෙල කල ශේෂ පිරික්සුම පහත දැක්වේ.

| | හර (රු) | බැර (රු) |
|---|---|---|
| විකුණුම් | | 350,000 |
| ගැනුම් | 180,000 | |
| ප්‍රාග්ධනය | | 400,000 |
| බඩු තොගය (2022.01.01 දිනට) | 10,000 | |
| ණයගැතියෝ | 30,000 | |
| ණයහිමියෝ | | 15,000 |
| 15% බැංකු ණය | | 150,000 |
| ඉඩම් හා ගොඩනැගිලි (පිරිවැයට) | 400,000 | |
| උපකරණ (පිරිවැයට) | 250,000 | |
| බැංකු ණය පොළී | 6,000 | |
| විදුලි වියදම් | 14,000 | |
| විකුණුම් සේවක වැටුප් | 12,000 | |
| ලද වට්ටම් | | 5,000 |
| දුරකථන ගාස්තු | 3,000 | |
| ප්‍රචාරණය | 8,000 | |
| අතැති මුදල් | 7,000 | |
| | 920,000 | 920,000 |

**අමතර තොරතුරු**

- 2022.12.31 දිනට ඉතිරි බඩු තොගය රු.20 000කි.
- උපචිත විදුලි ගාස්තු රු.5 000 කි.
- උපකරණ 10% බැගින් වාර්ෂිකව සරල මාර්ග ක්‍රමයට ක්ෂය කළ යුතුය.

**අවශ්‍ය වන්නේ**

(අ) 2022.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ ප්‍රකාශනය (ල 4)

(ආ) 2022.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය (ල 4)

(මුළු ලකුණු 12)